මට ඕනෙ සංගීත ක්ෂෙත්‍රයේ ඉත්ත ඔක්කාම එක්ක සාමූහික ගමනක් යත්තයි

රොෂාන් ශ්‍රීමන්ත ලිංකොටගේ

ශ්‍රීනාත්
මොනවද රොෂාන් මේ දවස්වල අලුතින් කරන්න යන වැඩ
රොෂාන්
මේ මාසෙ 30 වෙනිදා ප්‍රසංගයක් පවත්වන්න සැළසුම් කරලා තියෙනවා. ඩිනර් ඩාන්සි එකක්. හැමෝටම ඇවිල්ලා සින්දු අහලා හිතේ තියෙන කරදර ටිකක් මගඇරගන්න කරන වැඩක්. අවුරුද්දත් ඉවරවෙනවනෙ.

ශ්‍රීනාත්
මේකත් මෙපුර ගී වගේ වැඩක් ද?
රොෂාන්
නෑ ඊට වඩා වෙනස්. මං මුලිනුත් කිව්වනෙ මේක විනෝද වෙන වැඩක් කියලා.
මෙපුර ගී ප්‍රසංගය නැවත වාරයක් පවත්වන්න අදහසක් තියෙනවා. මෙපුර ගී පටන්ගත්තෙ මෙහි ඉන්න හුඟක් ගායකයන්ට එකම වේදිකාවක ගායනා කරන්න අවස්ථාව උදා වෙනවා අඩුයි. මට ඕනෙ වෙලා තිබුනෙ මේ අය එකට මුණගස්වන්න. ප්‍රසංගය සාර්ථක වුණා. අපි සතුටුයි.

ශ්‍රීනාත්
කොහොමද සංගීත ක්ෂෙත්‍රයට පිවිසුණේ?
රොෂාන්
මම ඉස්කෝලෙ ගියේ වෙන්නප්පුවේ ජෝසප් වාස් විද්‍යාලයට. ඉස්කෝලෙදි මම ඊස්ටර්න් බෑන්ඩ් එකේ හිටියා. අපි 1986 සමස්ත ලංකා ගායනා තරගයෙන් තුන්වෙනි තැන දිනුවා. මට ඒක කවදාවත් අමතක වෙන්නෙ නැහැ. ඒ එක්කම සත්සර කියලා ඉස්කෝලෙ හිටපු යාලුවො එකතු වෙලා බෑන්ඩ් එකක් දැම්මා. ඒකෙ නිත්‍ය ගායකයා හැටියට හිටියෙ මම. ඒ 1986 දි. එතකොට මම ඉස්කෝලෙ 9 වෙනි පන්තියේ. මම ඉස්සර කිව්වෙ රූකාන්තගෙ සින්දු.

ශ්‍රීනාත්
ගිටාරය අතට ගත්තෙ කොහොමද?
රොෂාන්
ඒක අහම්බෙන් වුණා දෙයක්. අපේ අම්මට ගිටාරය සහ පියානෝව වාදනය කරන්න පුලුවන්. ඒ වුණාට මට කිසිම ආසාවක් තිබුණෙ නැහැ ඉගෙනගන්න. ඔය අතරේ තරු කියලා ටෙලි නාට්‍යයක් රූගත කරන්න අපේ ගෙදරට ආවා කීර්ත් පැස්කුවෙල්. මම ඒ ටෙලි නාට්‍යයේ පොඩි චරිතෙකුත් රඟ පෑවා. මට අද වගේ මතකයි ඒ ග්‍රැන්විල් රොඩ්‍රිගු එක්ක. එතනදි අපේ ගෙදර තිබුණ ගිටාරය දැක්ක කීර්ති මට පළමු කෝඩ්ස් ටික කියලා දුන්නා. කීර්ති පැස්කුවෙල් නැත්නම් මම කවදාවත් ගිටාර් වාදකයෙක් වෙන්නෙ නැහැ. මම මේ වෙලාවෙ ඔහුට හදවතින්ම ස්තුති කරනවා.

ශ්‍රීනාත්
එතකොට එහනම් වාදකයෙක් ගායකයෙක් විතරක් නෙවෙයි නලුවෙකුත් වෙලා නේද?

රොෂාන්
ඒක අහම්බෙන් වෙච්ච දෙයක්. රඟපාන එක ලේසි-පාසු කාරියක් නෙවෙයි. සංගීතය පැත්තටම මම හිත යොමු කළා.

ශ්‍රීනාත්
රඟපාන්න අවස්ථාවක් ලැබුණොත් රඟපානවද?
රොෂාන්
දැනුත් රඟපානවා. ජීවන සටන

ශ්‍රීනාත්
ඔස්ට්‍රේලියාවට ආවෙ මොන අවුරුද්දෙද?
රොෂාන්
1990 දි. මම ආවෙ ඉගෙනගන්න. මම ඉගෙනගත්තා ෆුඩ් ටෙක්නොලොජි ඇන්ඩ් ෆාමසියුටිකල් මැනුෆැක්චරිං.

ශ්‍රීනාත්
දැන් රස්සාව කරන්නෙත් ඒ ක්ෂෙත්‍රයේම ද?
රොෂාන්
ඔව්. එම ක්ෂෙත්‍රයෙමයි.

ශ්‍රීනාත්
මෙහෙ සංගීත කණ්ඩායමකට බැඳුනෙ කොහොමද?
රොෂාන්
මම සාදයකදි ගීතයක් ගායනා කරනකොට ඒ දැකපු සුනිල් වීරසිංහ මහත්මයා මාව බ්ලොසම්ස් සංගීත කණ්ඩායමේ ටිදම් ගිටාර් වාදකයා ලෙස බඳවා ගත්තා. ඊට පස්සෙ ඔහු විසින් ආරම්භ කරන ලද ටිද්ම කියන සංගීත කණ්ඩායමට බැඳුණා. ඔහුටත් මම ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රීනාත්
ඔබගේ සංගීත කණ්ඩායම ආරම්භ කලේ මොන කාලෙද?
රොෂාන්
1997 බී ෂාප් නමින් සංගීත කණ්ඩායමක් මගේ නායකත්වයෙන් යුක්තව පටන් ගත්තා. තාමත් ඒ සංගීත කණ්ඩායම පවත්වාගෙන යනවා.

ශ්‍රීනාත්
පවුලේ විස්තර ටිකක් කියමුද?
රොෂාන්
තාත්තා ඉන්නවා. අම්මා නැතිවුණා. සහෝදරියො තුන්දෙනෙක් ඉන්නවා. ඒ අය සේරම ඉන්නෙ ඔස්ට්‍රේලියාවෙ. ශිරෝමා ශ්‍රීනි ශිරන්ති

ශ්‍රීනාත්
විවාහ වුණෝ මොන අවුරුද්දෙ ද? ප්‍රේම සම්බන්ධයක් ද?
රොෂාන්
විවාහ වුණෝ 2000 දි. එයත් මෙහේ ඉගෙනගන්න ආව කෙනෙක්. නමුත් යෝජිත විවාහයක්. ඇගේ නම සුරංගි ප්‍රනාන්දු. මට දරුවො තුන්දෙනෙක් ඉන්නවා. දිනෙලි ශිනෙලි පුතා රොචේන්

ශ්‍රීනාත්
සංගීත වැඩ වලට බිරිඳගේ සහය කොහොමද?
රොෂාන්
එයා සම්පූර්ණ සහය මට දෙනවා. එහෙම සහය දුන්නෙ නැත්නම් මේ වගේ ගමනක් යන්න අමාරුයි. සංගීත කණ්ඩායමක් පවත්වාගෙන යනකොට කැපවීම් කරන්න වෙනවා. සමහර විට පවුලට කෙරෙන්න ඕනෙ යුතුකම් වල පවා අඩුපාඩු සිදුවෙනවා. නමුත් ඒ සියලුදේ ම සුරංගි බලා ගන්නවා.

ශ්‍රීනාත්
අලුත් සීඩී එක එන්නෙ කවදද?
රොෂාන්
2005 දි මම පළමුවෙනි සීඩී එක කළා. දෙවෙනි එක කරන්න මේ දවස් වල සැළසුම් කරගෙන යනවා. පළවෙනි එකට සියලු ගීත රචනා කලේ සංගීතය සැපයුවේ ලංකාවෙ ජීවත් වන අය. නමුත් මම හිතාගෙන ඉන්නෙ දෙවෙනි එකට සියලුම දේවල් මෙහෙ අයත් එක්ක කරන්න.

ශ්‍රීනාත්
ක්ෂෙත්‍රයේ උදව් තළ අය කව් ද?
රොෂාන්
කීර්ති පැස්කුවෙල් මැල්කම් ෆොන්සේකා නිහාල් ගම්හේවා සුනිල් වීරසූරිය ඇතුලු බොහෝ දෙනා. ඒ වගේම මගේ පවුලේ උදවිය.
ශ්‍රීනාත්
අනාගත බලපොරොත්තු
රොෂාන්
මගේ සංගීත කණ්ඩායම සාර්ථක සංගීත කණ්ඩායමක් ලෙස ඉදිරියට ගෙනයාමත් මෙපුර ගී වැනි ප්‍රසංගයක් සියලු දෙනාගේම සහයෝගයෙන් ඉදිරිපත් කිරීමටත් මෙහි වෙසෙන සංගීත ක්ෂෙත්‍රයට ඇලුම්කරන සියලුදෙනාත් සමග සාර්ථක ගමනක් යන්න

ශ්‍රීනාත්
ඔබට ස්තුතියි. සියලු දෙනාටම දෙසැම්බර් 30 වෙනිදා පවත්වන ඩිනර් ඩාන්ස් එකට ගිහිල්ලා රොෂාන් සමග බී ෂාප් සංගීත කණ්ඩායමත් සමග සතුටු වෙන්න ඔබටත් අවස්ථාවක් තිබෙනවා.

මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

සන්නස සාහිත්‍ය තරගාවලිය 2007

නිර්මාණ බාරගන්නා අවසාන දිනය
2007 මාර්තු 31

විවෘත අංශය
වයස් සීමාවකින් තොරව ඕනෑම ශ්‍රී ලාංකකයෙකුට විවෘත අංශයට සහභාගි විය හැකි ය.

කණිෂ්ඨ අංශය
වයස අවුරුදු 18 ට අඩු තරගකරුවනට/තරග කාරියනට මේ අංශය වෙන් වෙයි.

කෙටි කතා (විවෘත/කණිෂ්ඨ)
පොදු කොන්දේසි
1 කෙටි කතා සඳහා වචන සීමාවක් නැත.
2 තමන්ට කැමති තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති නිර්මාණ සංඛ්‍යාවක් හැකි ය.
4 කෙටිකතාව තමාගේම නිර්මාණයක් බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමග එවිය යුතුය.

කාව්‍ය නිර්මාණ (විවෘත/කණිෂ්ඨ)
පොදු කොන්දේසි
1 වචන සීමාවක් නැත
2 තමන්ගේ අභිමතය පරිදි සඳැස් හෝ නිසඳැස් නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති සංඛ්‍යාවක් නිර්මාණ ඉදිරිපත් කිරීමට අවසර ඇත.
4 නිර්මාණය තමන්ගේම බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමගම එවිය යුතුය.

සියළුම අංශ සඳහා පොදු කොන්දේසි
1 සැම නිර්මාණයක්ම **පිටපත් තුනකින්** යුතුව එවිය යුතු ය.
2 තරගයට ඉදිරිපත් කරන නිර්මාණ මෙයට පෙර ප්‍රකාශිත ඒවා නොවිය යුතු ය.
3 තරගයට එවන නිර්මාණ නැවත ආපසු එවීමට හැකියාවක් නැති බව සළකන්න.
4 නිර්මාණ බාරගන්නා අවසාන දිනය **2006 මාර්තු 31** වෙයි.
5 තරගය පිළිබඳ මතුවන ගැටළු වලදී සන්නස සංස්කාරකගේ තීරණය අවසන් තීරණය බව සළකන්න.

සන්නස වාර්ෂික සාහිත්‍ය තරගය 2007
Sannasa
PO Box 172 Reservoir
Vic 3073 Australia

සන්නස වාර්ෂික සාහිත්‍ය තරගය 2006

සන්නස වාර්ෂික සාහිත්‍ය තරගය 2007 වෙනුවෙන් මුද්‍රණය කෙරෙමින් පවතින කෙටිකතා සංග්‍රහයේ වැඩ කටයුතු දැන් බොහෝ දුරට අවසන්ව ඇත. සියලුම ජයග්‍රාහකයනට හා ජයග්‍රාහිකාවනට සහතික ප්‍රදානය මෙම කෙටිකතා සංග්‍රහය නිකුත්වීම හා සමගාමීව පැවැත්වීමටඅපි අදහස් කරමු. වැඩිදුර විස්තර ඉදිරි සන්නස කළාපවල බලා පොරොත්තු වන්න.

මෙම කෙටිකතා සංග්‍රහයට ඇතුළත් වන කෙටිකතා ලියූ පහත නම් සඳහන් ලේඛක ලේඛිකාවනට හැකි ඉක්මනින් සන්නස කාර්යාලය අමතන මෙන් දන්වමු.

තුසිත් අබේනායක
පද්මිණී තෝරකුඹුර
ශ්‍රියානි පෙරේරා
මේනකා ජයතිලක
පද්මසිරි හේරත්
හැරිස් පරකන්දෙනිය
ර චන්දුසූරිය
සුභෘෂිනී හේරත්
දමින්ද දම්පහලගේ
පුෂ්පිකා ගම්ගේ